203

චක්‍රලේඛ අංක : 94/8

මගේ අංකය : එල්2/5/42
කෘෂිකර්ම, ඉඩම් හා වනසම්පත් අමාත්‍යාංශය,
493, ටී.බී.ජයා මාවත,
කොළඹ 10.
1994 දෙසැම්බර් මස 06 වැනිදා

ඉඩම් කොමසාරිස්

පළාත් ඉඩම් කොමසාරිස් (සියලුම)

ප්‍රාදේශීය ලේකම් (සියලුම)

## නිවාස සඳහා රජයේ ඉඩම් බෙදාදීම හා පැවරීම

නිවාස තැනීම සඳහා රජයේ ඉඩම් බෙදාදීමේ දී සම්මත ප්‍රමාණයක් නිශ්චය කිරීමේ අවශ්‍යතාවය පැන නැගී ඇත.

එවැනි සම්මතයක් නොමැති නිසා බොහෝවිට ප්‍රශ්නාත්මක වන අයුරින් විවිධ ප්‍රමාණයන් ඒ සඳහා වෙන් කෙරෙන බව පෙනේ. පර්චස් 10 වැනි සුලු ප්‍රමාණයක සිට, අක්කර 2 – 3 වැනි ප්‍රමාණයන් ඒ සඳහා නිර්දේශ කර ඇති අවස්ථා වාර්තා වේ.

නිවාස සංවර්ධන කටයුතු සඳහා දැඩි ඉඩම් ඉල්ලුම සහ ඒ සඳහා ඉතිරි වී ඇති භූමි ප්‍රමාණයේ සීමාසහිත බව නිසා, වෙන් කරනු ලබන බිම් ප්‍රමාණය, සීමා කළ යුතුය. එසේ සීමා නොකළහොත්, නිවාස සඳහා බෙදාදීමට ප්‍රමාණවත් ඉඩම් ඉදිරියේ දී ඉතිරි නොවිය හැක. එක් අයෙකු සඳහා අවශ්‍ය අවම ප්‍රමාණයට වඩා ඉඩම් බෙදාදීම සමාජ අසාධාරණයකට ද හේතු විය හැක.

එම නිසා, ඒ ඒ ප්‍රදේශයන්හි ඇති ඉඩම් ප්‍රමාණය, ඉඩම්වල වාණිජ අගය, ඉඩම් සඳහා ඇති ඉල්ලුම වැනි සාධක සලකා, මින් ඉදිරියට, පහත දැක්වෙන සීමාවන් තුළ නිවාස අරමුණු සඳහා ඉඩම් බෙදාදීම සහ පැවරීම කළ යුතු යැයි ගරු කෘෂිකර්ම, ඉඩම් හා වනසම්පත් අමාත්‍යතුමා විසින් තීරණය කර ඇත.

(1) නුවරඑළිය නගර සීමාව තුළ, ඉඩම් ප්‍රමාණය පර්චස් 10 ට සීමා විය යුතුය.

(2) ජනාකීර්ණ අන් නගර සීමාවන් තුළ ද, උපරිම සීමාව පර්චස් 10 විය යුතුය.

(3) දිවයිනේ අනිකුත් ප්‍රදේශවල උපරිම ප්‍රමාණය පර්චස් 30 විය යුතුය.

අනුරාධපුර නගරය තුළ ඉඩම් කට්ටි කැඩීමේ සැළසුම් මත, දැනටමත් බෙදාදී ඇති බිම් කට්ටි පැවරීම සඳහා පිළිගත යුත්තේ, එම බිම් කට්ටි සැළසුම් අනුව නිශ්චය කොට, ඇති බිම් ප්‍රමාණය යි. එසේ වුවද, එම බිම් සඳහා උපරිම ප්‍රමාණය පර්චස් 40 විය යුතුය.

මින් ඉදිරියට, නිවාස සඳහා ඉඩම් කට්ටි බෙදාදීමේ දී සහ පැවරීමේ දී ඉහත සඳහන් සීමාවන්ට කටයුතු කරන්න.

ටී.එච්.කරුණාතිලක
අතිරේක ලේකම්
කෘෂිකර්ම, ඉඩම් හා වනසම්පත් ලේකම් වෙනුවට